**GLOBAL ACADEMIC RESEARCH INSTITUTE**

COLOMBO, SRI LANKA

**GARI International Journal of Multidisciplinary Research**

ISSN 2659-2193

**Volume: 08 | Issue: 01**

On 31st December 2021

http://www.research.lk

Author: Ranchamara DLIS

University of Visual & Performing Arts, Sri Lanka

GARI Publisher | Visual & Performing Arts | Volume: 08 | Issue: 01

Article ID: IN/GARI/ICMDVPA/2021/111A | Pages: 83-89 (16)

ISSN 2659-2193 | Edit: GARI Editorial Team

Received: 21.07.2021 | Publish: 31.03.2022

# ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි ගාඩි වංශිකයන්ට සුවිශේෂී කලාංගයන් ආශ්‍රිතව දේශීය නර්තන කලාවට වූ බලපෑම

ඩී. එල්. අයි. එස්. රන්චාමර.

ප්‍රාසංගික කලාවේදී විශේෂ උපාධි, (සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය)

ජාතික ඩිප්ලෝමා රංගවින්‍යාසකරණය , (ජාතික පදනම් ආයතනය)

බලපත්‍රිති ලුතිනන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව,

බාහිර කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය.

indunilranchamara@gmail.com

(0094)071-2055887

**පර්යේෂණ ගැටලුව** - ගාඩි වංශික කාන්තාවන් අතර පැවති යැයි අනාර්ත තැටි කැරකවීම නමු වූ කලාංග ඇසුරෙන් රබාන් කැරකවීමේ නර්තනය ප්‍රභවය ලැබී ද? වන්න මා මනසෙහි ස්මෘතික වන්නට විය. එමෙන්ම ඔවුන් තුළ වූ සංස්කෘතික අංගයන් ආශ්‍රිතව දේශිය නර්තනයට ද බලපෑමක් සිදු වුනි ද? යන කුතුහලය මෙම විස්තෘත පත්‍රිකාවේ පර්යේෂණ ගැටලුවයි.

**උපන්‍යාසය** - ගාඩි වංශිකයන් අතර පැවති උපසංස්කෘතික ලක්ෂණ දේශිය නර්තන කලාව උදෙසා බලපා ඇත.

**වැදගත්කම -** අද්‍යතනයේ දී උක්ත ජන කොටසක් වශයෙන් කුලකගතව ජිවත් නොවූව ද ශ්‍රී ලාංකේය අතීත ජන ප්‍රවාහයෙහි සුවිශේෂී වූ ගතික සංස්කෘතික ලක්ෂණයන්ගෙන් හෙබි පිරිසක් වශයෙන් ඔවුන් තුළ වූ සංස්කෘතික කරුණු අනාවරණය මානව විද්‍යා පර්යේෂකයන් ප්‍රධාන සියලු පර්යේෂකයන්ට මූලාශ්‍රයක් වශයෙන් මෙහි දැක්වෙන කරුණු භාවිත කළ හැකි වීම.

මේ වන තෙක් කිසිදු පර්යේෂකයෙකුගේ අධ්‍යයනයට ලක් නේවූවා යැයි උපකල්පනය කෙරෙන උක්ත වංශික පිරිසගේ සංස්කෘතිකාංග ආශ්‍රිතව දේශිය නර්තනයට සිදු වූ බලපෑම පිළිබඳව අධ්‍යයනය මාගේ අධ්‍යයන කටයුතු සඳහා ඉවහල් වීම.

**හැඳින්වීම -** ශ්‍රී ලාංකේය ජන සමාජ විකාශනයේ දී කුලීන හා කුලහීන ආදි වශයෙන් සමාජ කොට්ඨාසයන් ද්විත්වයක් පවුල් පසුබිම්, ජිවනෝපාය මාර්ග මත වර්ග වී ඇත. රොඩී,[1] ගාඩි,[2] සහ හුලවාලී ආදි විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලබන උක්ත සුවිශේෂී වූ ජන කොට්ඨාසය බුද්ධ කාලීන සමාජයේ [3] සිට රාජාණ්ඩු සහ විසි එක්වන සියවස පුරා විකාශනය වුව ද ඔවුන්ටම ආවේණික වූ උප සංස්කෘතික ලක්ෂණයන් කාර්මීකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයන් හේතුවෙන් අද්‍යතන සමාජයෙන් වියැකී යමින් පවතියි. ස්වභාෂාවක් හසුරවන මෙම ජන කොටස ගාඩි යන නාමයෙන්

[1] ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, වැලිවිටියේ සෝරත හිමි. (සංස්) අනුල මුද්‍රණාලය, ඩීන්ස් පාර, කොළඹ 10, ප්‍රථම භාගය, ද්විතීය මුද්‍රණය, 1963, 330 පිටුව.

[2] විජයතුංග හරිස්චන්ද්‍ර, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය - 1 වන කාණ්ඩය, 1982, 612 පිටුව.

[3] වසල සූත්‍රය, අමාවතුර සමුබුද්ධ ජයන්ති ධර්මදේශනා දෙවැනි සාණ්ඩය, අස්සගුණවත්තේ අරියජෝති ස්ථවිර (සංස්), නව ජිවන මුද්‍රණාලය, වැල්ලම්පිටිය, බු.ව. 2500 (1950) 2 වන පරිච්ඡේදය.

ඔවුන්ව හැඳින්වීමට දැඩි ලෙස ප්‍රිය කරති. මේ බැව් ඔවුනතර " මහ ගාඩියා, ගාඩි බිළිඳා " සහ ගාඩි බිළන්දි ආදී යෙදුම් භාවිතය මගින් පැහැදිලි වෙයි. ප්‍රභූ සහ කුලීන සමාජය විසින් මෙම ජන කොටස් ඉතා පහත් වූ ගති පැවතුම් ඇති පිරිසක් ලෙස ඔවුන් පහත් කොට සලකා කටයුතු කර ඇත.

නමුත් ඔවුන් තුළ වූ ශක්‍යතාවයන් හා අනන්‍ය වූ ශිල්ප ක්‍රමයන් නිසා ඔවුන් සිංහල ජන සමාජයෙහි සුවිශේෂී ජන කොටසක් බව දැක්විය හැකිය. උක්ත වංශිකයන් රාජ්‍ය පාලන තන්ත්‍රයට සම්බන්ධ වන්නේ රජගෙට මස් මාංශ සැපයීම සඳහා බව සඳහන් වෙයි.[4]

12 වන ශත වර්ෂයේ දී රාජ්‍ය ප්‍රාප්ත මහා පරාක්‍රමබාහු හෙවත් පැරකුම් රජුට මස් සපයනු ලබන පුද්ගලයාට එක් පුන් පොහොය දිනයක දී මස් සපයාගත නොහැකි වීම නිසා කුඩා දරුවෙකු මරා මස් කර රජුට සැපයීමෙන් පැරකුම් රජුගේ දියණිය වූ රත්නවල්ලී කුමරිය එම මාංශයට ගිජු වූ බැවින් දෛනිකව කුඩා දරුවන් මරා රජගෙට සැපයීම පිළිබඳ පුවත් රජුට අනාවරණය වූ බැවින් රජගෙට මස් සපයන පුද්ගලයා සහ තම දියණිය දීනයන් (රෝඩියන්) ලෙස සලකා දිවි තිබෙන තුරු ගෙයින් ගෙට සිඟමනේ යමින් දිවි තර කිරීමට නියෝග කරන ලද බැව් ද මෙම ජන වර්ගයේ ප්‍රභවය හා සම්බන්ධ විවිධ මත ශ්‍රී ලාංකේය ජන ශ්‍රැතියෙහි පවතී. [5]

මෙලෙස ඔවුන්ගේ ජීවනෝපාය උදෙසා එක් බෙර ඇසක් පමණක් ඇති "එකැස් බෙරය"[6] යැයි හඳුන්වන රබාන සහ තැටිය නම් වූ භාණ්ඩයන් ආශ්‍රිතව ප්‍රාසංගික ඉදිරිපත් කිරීම් මගින් ඔවුන්ගේ දිවි තර කර ගැනීමට ඔවුන් දිවයින පුරා සංක්‍රමණය වෙමින් ශ්‍රී ලංකාව පුරා තම වර්ග පරම්පරා විකාශනය කරන්නට ඇත. කෝට්ටේ රාජධානි සමයෙහි රජකළ පරාක්‍රමබාහු රජ සමයේ දී සැඩොල් කුලයට අයත් චණ්ඩාල කුලයක් ලෙස රොඩී ජනතාව හැඳින්වන්නට ඇත. එහිදි රජ මාළිගය ඇමදූ "රොඩ්ඩා" හා පැරකුම් රජ දියණිය වූ රත්නවල්ලී කුමරිය අතර වූ සබඳතාවය හෙළි වීම නිසා රාජ කුමාරිකාව රොඩ්ඩාට අඹුකමට දී රාජ මාළිගාවෙන් පිටුවහල් කළ බවට ද කතා ප්‍රවෘත්තියකි.

ශ්‍රී ලාංකේය කුලක්‍රමය පිළිබඳව සඳහන් වූ ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස "ජන වංශය, සද්ධර්ම රත්නාවලිය, සිංහල බෝධි වංශය, මහා බෝධි ග්‍රන්ථ විවරණය, මහා වංශය, චූල වංශය සහ ජේතවනරාම, සහස්සමල්ල ආදි සෙල්ලිපි දැක්විය හැකිය. [7]භාරතීය කුල සංකල්පය ශ්‍රී ලාංකේය ජන

---

[4] නර දෙයියන්නේ ඔබෙ අණසක පතුරන්ට
පස්වා දහසකට තේජස බැබළෙන්ට
කමු පුල්ලෙන් ඇණ අප වෙත නොතලන්ට
රෑ නිදි නොලැබ දඩමස් සපයම් දෙන්ට

අවසර දෙපෝදා සහ අටවක දෙකට
දඩයම් නොකර එයටත් මස් සැහෙන්ට
මා වාසලේ වැජඹෙන නර දෙයියන්ට
වරම් ලැබුනේය මස් දෙන්න කරුමෙට

[5] දේශීය ඉවුම් පිහුම්, විජේසිංහ පීටර්, ජන සාහිත්‍ය රචනා 44 වෙළුම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, කොළඹ 07, 1959, 62: 54 පිටු

[6] "එකැස් බෙරය"ලෙස ඇතැම් තැන්හි බුම්මැඩියද හඳුන්වයි. තෙන්නකෝන් ජයතිස්ස, රුහුණු රබන් සුරල් සව්දම් සහ රබන් සෙල්ලම්, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, චතුරමුද්‍රණාලය, ප්‍රථම මුද්‍රණය, 2015, 35, 36 පිටු

[7] දිසානායක මුදියන්සේ, වන්නියේ සමාජ සංවිධානය සහ නවීකරණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, අංක 675, පී. ද. ඇස්. කුලරත්න මාවත, කොළඹ 10, 1997, 77 පිටුව

සමාජයේ කුල ක්‍රමය් ප්‍රභවය උදෙසා බලපා ඇත.[8] මන්දයත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වීමත් සමඟ ශිල්ප ශ්‍රේණි 18 කට අයත් කුල පිරිස් මෙරටට සංක්‍රමණය වූ බව දැක්වේ.[9]

කුලය (Caste) සම්බන්ධ බටහිර මතවාදයන් විමසීමේ දී මානව විද්‍යාඥයෙකු වූ ඒ. එල්. කෝබර් කුලය පිලිබඳ දක්වන්නේ "දැඩි වූ ද, උග්‍ර වූ ද ජන්මයෙන් නියම කරන ලද්දා වූ පුද්ගල සංචලතාවයට අවකාශ නොදෙන්නා වූ ආයතනයක් ලෙසත්, "කුලය සාම්ප්‍රදායික වූ රැකියාවන් ආශ්‍රිත වූ දෙයක් ලෙසත් "හේටන්" දක්වා ඇත.[10]

රාජාණ්ඩු ක්‍රමයන් හී පාලන තන්ත්‍රයෙහි අවශ්‍යතාවවය පුර්ණය කිරීමේ අරමුණින් රැකියාව මත පදනම්ව කුල සංවිධාන බිහි වී ඇත. මෙහිදී ශ්‍රී ලංකේය ජන සමාජයෙහි

i. බ්‍රාහ්මණ - උගත්, පුජක පක්ෂය
ii. ක්ෂත්‍රීය - පාලක පංතිය
iii. ගහපති (වෛශ්‍ය) - ගොවීන් සහ වෙළඳ පංතිය
iv. ශුද්‍ර - පහත් අඩුකුල පංතිය[11]

මෙලෙස කුල මූලිකව කොටස් හතරකට වර්ග කර ඇත. ශ්‍රී ලංකාවේ පුරාතනයේ පැවති කුල පිළිබඳව සිංහල ශබ්ද කෝෂ කතුවරයා මෙලෙස දක්වා ඇත.

"කරා පරවර මල් ද පලි පලි පදු රදා කින්නර ගහල පුක්කුස
දුරව හඟරන් රෝඩී කම්කරු වඩුද ඒ නේසාද නන් ලෙස
නරන් බරවා බැඩල් බඩගුල් පෙහෙර නින්නා අඳ දනන් ලෙස
තිරා සඟ ලෙස හීන කුලවල දනෝ යැයි පැවසුවොත් සොඳ ලෙස"[12]

එම කුල අතරින් රොඩී කුලය පහත් කුලයක් ලෙස ජන ව්‍යවහාරයෙහි දැක්වේ. මන්දයත් "රොඩ්ඩ" යනු ඉවත ලන දෙය ලෙස ද ව්‍යවහාර කරනු ලබයි. මේ බැව් සිංහල ජන සමාජයෙහි භාවිත කවි,[13]

---

[8] විශ්වය මැවීම පිළිබඳ බ්‍රාහ්මණ මතයට අනුව මහා බ්‍රාහ්මයාගේ හිසින්, දෙව්රෙන්, දෙකලවෙන් සහ යටි පතුලෙන් උපන් පිරිස් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය සහ ශුද්‍ර සහ කුල සතරෙහි උපත පිළිබඳව දක්වා ඇත.

[9] සංඛ, ජූලි - දෙසැම්බර්, (සංස්) මහාචාර්ය මුදියන්සේ දිසානායක, ශස්ත්‍රපති ටියුරින් අබේවික්‍රම, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2004 අප්‍රේල් 29, 17 පිටුව

[10] කුලය පිළිබඳ සමාජ ඓතිහාසික විමර්ශනයක්, දයා අමරසේකර, නව සංස්කෘතික 1 කලාපය, 3-4 වෙළුම, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, කොළඹ 01, 1986.

[11] ඩේව් දුටු ලංකාව, සෝමරත්න එච්. එම්. එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1-19 පිටු

[12] සිංහල ශබ්ද කෝෂය, 21 කාණ්ඩය, 41 භාගය, සංස්කෘතික අමාත්‍යාංශය, 1992, 475 පිටුව

[13] අද්දර පැඳුරක් එලාන්˝ රොඩ්ඩාස වකුටුව නිදනා සද්ද නැතුව කෙඳිරිගාන්˝ සිද්ධ වුනේ හනික මනා

ආප්තෝපදේශ,[14] කියමන්[15] මගින් මනාව පැහැදිලි වෙයි. මළ මිනී බැහැර කිරීම, ඇතුන් ඇල්ලීම, වරමුදු සැකසීම, කුළු, ලාහ පෙට්ටි, කිරි ගොටු ආදී වේවැල් භාණ්ඩ සැකසීම මොවුන්ගේ රැකියා ලෙස ද දැක්වෙයි.

කුලීනයන් ලෙස සමාජයේ හැඳින් වුව ද රාජකීයන් උක්ත කුල වාසීන් සමග සමීප සම්බන්ධතා පැවැත්වූ අවස්ථා පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රයයන් අධ්‍යයනය කිරීමෙන් කරුණු අනාවරණය වෙයි. දුටුගැමුණු රජු පුත් සාලිය කුමරු විවාහ වී ඇත්තේ "හෙල්ලෝලි ගම" විසූ රොඩී කුල කාන්තාවක සමඟ (අශෝකමාලා) බවත් සාලිය කුමරු රජකම අත හැර තම ප්‍රියම්බිකාව සමඟ කල්ගත කළ බව සාලිය අශෝකමාලා ප්‍රේම වෘතාන්තය සිංහල ජන සමාජයෙහි ප්‍රචලිත ප්‍රේම වෘතාන්තයකි.

" අසොකමාලා දෙවිනං සාබඬං බුබ්බලපනියා
රූපෙනාකිපි යායනෙනා සෙ රාජ්ජං හෙව කාමයි
දුට්ඨගාමිණි භාතානො සද්ධාතිස්ස තද මචයේ
රජ්ජා කාරෙසි අභිසිහෙනා අට්ඨාරස සමාසමෙර්"[16]

මෙකී වංශිකයන්ගේ රැහේ නායකයා "හුලවාලියා" යන නාමයෙන් හඳුන්වා ඇත. යටත් විජිත පාලන සමයට පෙර ස්ථිර නිවසක ජිවත් වීමට අවස්ථාවක් නොලද වංශවත් යැයි නම් කරන ලද පිරිස් වෙත යටහත් පහත්ව ආචාර සමාචාර සහ සේවය කරනු ලැබූ පිරිසක් ලෙසත් සමාජයේ විවිධ තාඩන පීඩනයන්ට යටත් වූ පිරිසක් ලෙසත් මොවුන් හැඳින්විය හැකිය.[17] අද්‍යතන සමාජ ක්‍රමයෙහි එක් ගෝත්‍ර පිරිසක් වශයෙන් සාමුහිකව ජිවත් නොවුන ද උක්ත වංශික පිරිසට සුවිශේෂි වූ කලාංගයන් පිළිබඳ අවධානය යොමු කිරීම වටී. මොවුන් අතර ශ්‍රී ලංකාව පුරා විකාශිතව ජිවත් වීම නිසා වර්ග වශයෙන් බෙදා වෙන් කිරීමක් පැවත ඇත.[18] ආවාහ විවාහ මෙම වර්ග මත පදනම්ව සිදු කර ඇත. අතීතයේ දී මොවුන්ටම ගතික වූ සංස්කෘතික ලක්ෂණයන්වන භාෂාව,[19]
ඇඳුම් පැළඳුම් [20], සිරිත් විරිත් [21] කෙම් විධි මගින් සුවිශේෂී ගෝත්‍රයක් ලෙස මෙවුන් දැක්විය හැකිය.[22] මෙවැනි සංස්කෘතිකාංගයන්ට අයත් වන නර්තන සහ වාදනාංගයන් ඇසුරෙන් දේශිය නර්තනයට සිදු වූ බලපෑම පිළිබඳව සාකච්ඡා කිරීමට නියමිතය.

---

[14] " රොඩී පැලේ බල්ලෝ හිඟ නැත "

[15] " රොඩී රැහැට ගිය එකෙක් ආපහු ආවේ නැත. "

[16] ආරියපාල ඇම්. බී, මධ්‍යකාලීන සංකා සමාජය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු ප්‍රකාශන අංශය, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1962, 29 පිටුව.

[17] ඩේවි ජෝන්, ඩේවි දුටු ලංකාව, (අනු) එම්. එස්. සෝමරත්න, සී/ස ඇම්. සී. ගුණසේන සහ සමාගම, 1966, 66-67 පිටු.

[18] මහප්පොළ, තිරිංග, මීටංගල, තලින්න, නා පොළ, ඌවෙ, වපොල්ල, නුවරගම, මං ගම, ගල්වෙල, තම්මංකඩ, අල්පග ලෙස දක්වා ඇත

[19] මොවුන්ගේ භාෂාව ගාඩි බස ලෙස හැඳින්වෙන අතර ආටි බස යනු රහස් සන්නිවේදන භාෂාවක් ලෙස මොවුන් භාවිත කරයි. මෙම භාෂාව අද්‍යතනයේ දී භාවිතය දන්නා පිරිස් ද හිඟය.

[20] වික්‍රමසිංහ මාටින්, පුරාණ ස්ත්‍රීන්ගේ ඇඳුම් පැළඳුම්, මවුන්ට් මුද්‍රණාලය, ගල්කිස්ස, 1935, 44 පිටුව වැඩි දුරටත් දක්වා ඇත."පිරිමින් ඉණට රෙද්ද ඇඳ අතින් කෝටුවක් ගෙන කද කරේ තබා යයි. ස්ත්‍රීන් ඉණට රෙද්ද ඇඳ කිහිල්ලට් යටින් බඳී "

## සාකච්ඡාව

ගාඩි සමාජය ආශ්‍රේව භාවිත එකැස් බෙර වාදනය, තැටි කැරකවීම, කබේ නැටුම, බෝල උඩ දැමීම වැනි සංස්කෘතිකාංග දේශීය නර්තනය හා සබැඳි නර්තන, වාදන සහ ගායන මෙන්ම අභිචාර සඳහා ද ඉවහල් වී ඇත. ඉතිහාසගත මූලාශ්‍රයන්ට අනුව " රොඩ්ඩා එකැස් බෙර ගසන විට රත්නවල්ලි නැටූ බවත්, රජ මාළිගයෙන් නෙරපා හරින විට රජ මාළිගයෙන් ඔවුන් වෙත ලැබුනේ " එකැස් බෙරය සහ තැටිය පමණක් බවත් සඳහන් වුව ද එම අවනද්ධ භාණ්ඩය ලැබුනේ බෙරකාරයාගේ නිවසෙහි රැය පහන් කිරීමෙන් බව ජන ශ්‍රැතියෙහි මතයක් පවතී.[23]

තූර්ය භාණ්ඩ නාමාවලීන් හී එකැස් බෙර ලෙස දක්වා ඇත. එකැස් බෙරය යනු ආතතය ගණයෙහි ලා ගැනෙන බෙරයකි.[24] එකැස් බෙරය ගාඩි වංශිකයන් භාවිත කළ බැව් පහත සඳහන් පද්‍යයෙන් වැඩි දුරටත් පැහැදිලි වෙයි.

"එදා සිටම මුනිඳුන් දුන්න අවසරේ

මෙරත් උණුවෙන්ඩ ගැසුවේ එකැස් බෙරේ

බෙරත් ගසා ගෙන්ගෙට ඇවිදින් නිහරේ

උරනන් අත්නවල්ලිගෙ නැටුම් පුරදරේ" [25]

මෙහි දැක්වෙන "රත්නවල්ලි" නම් වූ කාන්තා සංකල්පයේ දී ඇය රජ කුමාරිකාවක්, යක්ෂණියක්, ගාඩි කාන්තාවක් සහ සුහදශීලී මිතුරියක් ආදී වූ විවිධ වේශයන්ගෙන් දක්වා ඇත. ගාඩි කාන්තාවන් අතර ප්‍රචලිත කාව්‍යයක් ලෙස රත්නාවල්ලි කාව්‍යය දැක්විය හැකිය.

මෙහි දී රත්නාවල්ලි කුමරිය, පැරකුම් රජ, රන්තෙළඹුව සහ ගාඩි වංශයෙහි ඉතිහාසය පිළිබඳව තොරතුරු අනාවරණය කෙරෙයි.[26] එමෙන්ම රුවන්වැලි සෑය හා බැඳි සිද්ධිය හා සම්බන්ධ රන් තෙළඹු ගසට අධිපති දෙවඟන සහ රත්නවල්ලි දෙවඟන යනු එකම තැනැත්තියක් ලෙස දක්වා ඇත.

---

[21] සිංහල සිරිත් සංග්‍රහය, (සංස්)ඩී. ඊ. හෙට්ටිආරච්චි, වෙස්ලි මුද්‍රණාලය, කොළඹ 06, 1983, 124-126 පිටු

[22] රොඩී ජනයා ගෝත්‍රයක් මිස කුලයක් නොවේ මහාචාර්ය ජේ. බී. දිසානායක, සිළුමිණ, සී/ ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන් සමාගම, කොළඹ 02, 1979, 06-20

[23] කරුණාතිලක, ඇන්. ටී. සේනානායක කොලම්,ගාඩි වංශය, ආර්ය ප්‍රකාශකයෝ, නො 34, අගුරුවැල්ල පාර, වරකාපොළ, ගාඩි වංශය, 1990, 38 පිටුව.

[24] ජන සංගීතය, එඩ්මන්ඩ් ගනේගොඩ, ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විද්‍යාලය, FC 18, ජාතික පුස්තකාලය, කොළඹ, 1986

[25] රත්නවල්ලි මේ කවුද?, කොලට් සේනානායක, "ශ්‍රී සඟරාව" ස්වාධීන පත්‍ර සමාගම, 1982 10 බස, 21 පිටුව.

[26] ඉර නොපායයි ඉර රත්නවල්ලි

සඳ නොපායයි සඳ රත්නවල්ලි

නළලේ අඩ සඳයි බැම තිලකාවල්ලි

" නිල්බර නිල් රුකට පිට දී උන්නු ලියේ
නිල්බර නිල් වරල ගවසා බැන්ඳ ලියේ
නිල්බර සුරුක්කන් ගන රූබර දිලියේ
නිල්බර තෙළඹුවෙන් බහු රත්නවල්ලියේ " [27]

නමුත් මෙම වෘතාන්තයන් මහාවංශය සහ ථූප වංශය වැනි මූලාශ්‍රයන්හි දක්වා නොමැත. එමෙන්ම තැටි කරකැවීමේ දී ගායනා කරනු ලබන කාව්‍යයන් රත්නවල්ලිය හා සම්බන්ධ කාව්‍යයන් වෙයි. [28] ශ්‍රී ලංකා ඉතිහාසයේ කාන්තාවන් නර්තනය කිරීම පිළිබඳව තොරතුරු අනාවරණයෙන් පසක් වනුයේ ශ්‍රී ලාංකික ස්ත්‍රීන් නර්තනය කළා නම් ඒ ගාඩි පරපුරේ කාන්තාවන් පමණක් වීමත්, කාන්තාවන් නර්තනයේ යෙදීමේ ප්‍රථම නියෝජනය රොඩී කාන්තාවන් වීම සුවිශේෂී වෙයි.

උඩරට පළාතේ ජීවත් වන රොඩි කාන්තාවන් "නැට්ටුක්කාරියන්" යන නාමයෙන් හඳුන්වා ඇත.[29]

එමෙන්ම එම්. ඩී. රාඝවන් මහතා සඳහන් කරනුයේ කබේ නැටුම ඉදිරිපත් කර ඇත්තේ ද රොඩි කාන්තාවන් බවයි.[30] ඔවුන් ඔවුන්ටම ආවේණික වූ ගායනා ඉදිරිපත් කරමින් නර්තනය යෙදි ඇති ආකාරය පිළිබඳව මෙසේ දැක්වෙයි.

" පුරුෂයන් බෙර වයමින් ගී ගයන අතර, ස්ත්‍රීහු කබේ ගමන් කරමින් නටති. මොවුන්ගෙන් විනෝද ක්‍රීඩා හා ශිල්පාදිය පහනුවර පෙරහැරේ හා අනුරාධපුරයේ උත්සවවලදී දැකිය හැකිය. " ලෙස නන්දදේව විජේසේකර දක්වා ඇත. එමෙන්ම කබේ නැටුමේ දී භාවිත කළ කාව්‍යයන් ද මෙලෙස දක්වා ඇත.

---

පැරකුම් රජුගේ දුව නවරත්නවල්ලි

Sinhala Verse : Hugh Neville ,Volume 01,02

[27] රන් තෙළඹුව නම් දොඩමළු රුක, සුනිල් විජේසිරිවර්ධන, "තිර්ථ" වසන්ත කලාපය, 1 වෙළුම, විහවි සංස්කෘතික මධ්‍යස්ථානය, 1995, 76,77 පිටු

[28] තෙල් ගාලා වරලස ඔප කරපු ලියේ
මල් බැඳලා සියගත පඳගැවසුනා ලියේ
වෙස් බැඳලා නැටුමට ආවද ලියේ
ඇත බලා පලයන් රත්න වල්ලියේ

අතේ ගිගිරි අත මුල සෙල්ලි සෙල්ලියේ
පයේ ගිගිරි අත මුල සෙල්ලි සෙල්ලියේ
කරේ බැන්ද තවලන් පොට නොසේල්ලියේ
පැරකුම් රජුගෙ නව නවරත්න වල්ලියේ

ජන සාහිත්‍ය (සංස්) පීටර් විජේසිංහ, ජාතික පුස්තකාලය, 1982, 81-82 පිටු.

[29] M. D. Raghavan, Handsome Beggers the Rodiya of Ceylon, Colombo, Book Centre, 1957 page 54-55.

[30] නන්දදේව විජේසේකර, ලංකා ජනතාව, සී/ස ඇම්.සී. ගුණසේන සහ සමාගම, 1955, 41,42 පිටු.

01. විස්ස නමට බොල්ල සමඟ කතාව රහසේ

රස්සාවට බොහොම හොඳයි සිංහල දේසේ

ගස්සා බෙර දවුල් රබන් අරගෙන මෙලෙසේ

උස්සාකර යන්න හදමු එතර එදෙසේ

02. දේස දෙමළ කල්ලො වඩිග තෙගිගු පුරේ සිට

රාසි ගණන් එක සැදිලා සිංහල දේසෙට

දීසි එකඩ ලණු උණදඬු රැගෙන නික්ම සිට

වාසි දෙවොල් බොල්ල සමඟ නැගිලා ඔරුවට

03. ගොස් බැස මේ සිංහල රට දැක සිතු ලොල්ලේ

උඩ කුඹ අග කඹ ලණු බැඳ වටති පෙදල්ලේ

කඹ නැතුවට සෙනඟ ඇවිත් වටකර ගොල්ලේ

වැඩ සිටි සෙජකඩ ගල සහ නරතිනු පුල්ලේ [31]

ඉහත සඳහන් කාව්‍යයන්ට අනුව වඩිග, තෙළිගු ආදී දේශයන්ගෙන් කබේ නැටුම ලංකාවට සංක්‍රමණය වුවා යැයි අනුමාන කළ හැකිය.

"අත් මානම " යනු බෙර හෝ ගිගිරි උඩ දමා අල්ලාගනු ලබන කාන්තාවන් අතර ප්‍රචලිත ක්‍රීඩාවකි. මෙය " අත්මානම් කෙළිය " [32] ලෙස ද හඳුන්වයි. මෙකී ක්‍රීඩාව ද ගාඩි වංශිකයන් අතර ප්‍රචලිතව පැවති කලාංගයක් ලෙස දැක්වෙයි.

ගාඩි කාන්තාවන් තැඩි කැරකවීමට විශේෂ දක්ෂතාවයක් දක්වා ඇත. මොවුන්ගේ මෙකී ශක්‍යතාව පාරම්පරිකව මව් උරුමයෙන් මොවුන්ට දායාද වී ඇත. තැටි කැරකවීමට මනා පුහුණුවක් අවශ්‍යය. එමෙන්ම මොවුන් දෙදෙනෙකු හෝ කණ්ඩායම් වශයෙන් මෙම තැටි කැරකවීම ඉදිරිපත් කරනු ලබයි. රත්නවල්ලිය හා සම්බන්ධ ගායනා කරමින් තැටි කැරකවීමට මොවුන් ශක්‍යතාවයක් දක්වයි. මොවුන් කරකවනු ලබන කිලෝ ග්‍රෑම් 1.5 පමණ බර පිත්තල තැටි ලෝකුරු කර්මාන්තයේ නියැලෙන පිරිස්ගෙන් ඔවුන් වෙත ලැබුනු බව ගාඩි කුල කාන්තාවන්ගේ මතයයි.[33] සබරගමු නර්තන සම්ප්‍රදාය විකාශිත ප්‍රදේශයන්හි භාවිත එම ප්‍රදේශයට ආවේණික වූ ජන නැටුම් ලෙස තැටි කැරකවීම සහ කඹේ නැටීම ආදී නර්තනාංග දක්වා ඇත.[34]

## <u>නිගමන</u>

ගාඩි වංශිකයන්ට උරුම වූ තැටි කැරකවීම නම් වු නර්තනාංගය ඇසුරෙන් රබන් කැරකවීම නම් වු නර්තනය බිහි වු බවට නිගමනය කළ හැකි මත කිහිපයකි. මන්දයත්, එකැස් බෙරය සහ තැටිය යනු එකම ප්‍රමාණයෙන් යුත් ගාඩි ජනතාවට සමීපතම ජිවනෝපාය භාණ්ඩ ලෙස නම් කළ

[31] රබන් උපතේ විසිතුරු වතගොත, ජයන්ත අමරසිංහ.

[32] සිංහල ශබ්ද කෝෂය, ඩී. බී. ජයතිලක, ප්‍රථම භාගය, "අ-පෑ".

[33] බුරියාගේ මැණිකා සමඟ වදුරැස්ස, මුන්නේශ්වරම් අයියනායක දේවාලයේ දී කළ සම්මුඛ සාකච්ඡාව.

[34] සබරගමු නර්තන සම්ප්‍රදාය හා ශාන්තිකර්ම, වික්‍රමසිංහ බණ්ඩාර, සපරගමු සාම්ප්‍රදායික කුමාර සමයට, විශේෂ සමරු කලාපය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1995, 11 පිටුව.

හැකිය. මෙහිදී එකැස් බෙරය යනු රබාන සඳහා භාවිත කළ තවත් එක් අවශේෂ නාමයක් බව ථූප වංශය, දඹදෙනි අස්න, සද්ධර්මාලංකාරය, දළදා සිරිතආදී ප්‍රාථමික මූලාශ්‍රයන්හි දක්වා ඇත.[35]

එමෙන්ම දුරාතීතයේ දී පවා කාන්තාවන් රබන් නර්තනයේ යෙදුනු බව මුල්කිරිගල බිතු සිතුවම්හි දක්වා ඇති භාන්ඩ වයන ස්ත්‍රී රූපයන්හි රබානක හැඩයෙන් යුතු වාද්‍ය භාණ්ඩයක් වයන ආකාරයක් නිරූපණය වෙයි.[36] ආකෘතිමය වශයෙන් ප්‍රාථමික ගණයෙහිලා සැලකෙන මෙම වාද්‍ය භාණ්ඩය හැඳින්වීම සඳහා ඇතැම් කෘතීන්හී තැටි යන නාමය ද භාවිත කළ අවස්ථා නිරීක්ෂණය විය.

"සුරතමා ගනිමිනි එරන් තැටි නව සියක් බැස සුරගනේ වටපිට බලමින් සබේ එසලෙලුලියන් දෙස නෙතගිනේ දෙමිකිටා තක තරිකිටා පා තබ තබා උන් වෙත වෙනේ දුටු විටා නටනා නැටුම් එහි සිටි දනෝ කුල්මත් උනේ "[37] මෙහි තැටි නවසීයක් යනු රබන් නවසීයක් හැඳින්වීමට භාවිත කළ බැව් අනුමාන කළ හැකිය. එමෙන්ම තැටි කැරකවීමේ දී ඔවුන් විසින් ගායනා කරනු ලබන පහත දැක්වෙන ගායනා,

" සල් උයන්වලින් මල් තෙලබින්හෙනා දෙන්නට
තුන්තොටේ ගඟේ හා පරිසිඳු වන්නේ,

තුන්තොටේ ගඟේ ඔරුවෙන් එගොඩට ගොස් බැස
අමුතුවෙන් අලුත් පාරට පසිමින්නේ,

කල් වේලා බලා කල්දේරම් වල බත් පිස
පලා බද්දරදි සාගිනි නිවෙමින්නේ

උඩුකුලාන ලිහිනි පොල් බංගලවා පසුකරගෙන
හැරමිටි පාහේ එළියට බසිමින්නේ "[38]

සහ රබන් නර්තනයේ දී ගයනු ලබන ගායනා නාද මාලා, රචනා ශෛලීය සහ මාත්‍රා එකිනෙකට සමාන බැව් පහත දැක්වෙන රබන් නර්තනය සඳහා භාවිත කෙරෙන ගායනයන්ගෙන් පෑථුල වෙයි.

" දැන් නොවෙයි අපේ බෝසත් පෙර කාලේ
මහා සම්මතේ මුලින් රජ විය කප මූලේ
දෙව්ලොවෙන් ඇවිත් නදවා දෙව් එකලේ
පළමුව වෙන් රබන් රැඟුම් නෙර්තනය කලෙ රාලේ "

---

[35] කුලතිලක සී. ද. එස්, ලංකාවේ සංගීත සම්භවය, ඇස්. ගොඩගේ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය, අවිස්සාවේල්ල, 2007, 203 පිටුව.

[36] මුල්කිරිගල විහාරයේ සිතුවම් කර ඇති සිතුවම, රූපාවලිය.

[37] අමරසිංහ ජයන්ත, රබන් උපතේ විසිතුරු වතගොත.

[38] ජන සම්මත කවි ගී (සංස්) ටී. ඇඩ්. ධර්මබන්දු, "රන් තෙළඹුව හා රත්නවල්ලි " , සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 10, 1964, 169 පිටුව.

උක්ත කරුණු විමසු කල්හි නිගමනය කළ හැකි උපකල්පනය වනුයේ මුල්කාලීනව ගාඩි ජනතාව අතර ප්‍රචලිතව පැවති තැටි කැරකවීම ආදී අංග මහනුවර යුගයේ දී ප්‍රභූන් පිනවීමේ, රාජ සභා නර්තන ලෙස රබාන වාදනය කළ අතර කාලනුරූපීව තැටි කැරකවීම වෙනුවට ම වාදනය කළ රබාන යොදා ගැනීම මගින් රබන් කැරකවීමේ නර්තනය සහ අත් රබන් වාදනය මහනුවර යුගයෙන් පසුව උඩරට නැටුම් හා සංයෝජනය වී විකාශනය වූ බව නිගමනය කළ හැකිය.

කබේ නැටුම නම් වු ලාඩි පරපුරේ කාන්තාවන්ටම සුවිශේෂි වූ නර්තනයකි. මෙම නර්තනය පිළිබඳව මූලාශ්‍රගත තොරතුරක් ලෙස මහනුවර කවිකාර මඬුවේ දී රත්නාවල්ලි විසින් ඉදිරිපත් කළ " කඹේ නැටුම " පිළිබඳව " සාගර නයිදේ නම් වූ කවියා ගායනා කළ කාව්‍යයන් කිහිපයක් වෙයි.

"සලෙලු බොළඳ දාසිට තෙලඟු පිට ලියේ
සලෙලු කළ එළිය දකිනට වරෙන් ලියේ
නිලලු රණ තිසරු යුරු තන ලැම දිලියේ
වළලු අතලන්ඩ බහු රත්න වල්ලියේ

වීනි රංගි වල්ලිය නටයා කලියේ
ජෝති රත්න මැනිකක් දුටිමි සිතැලියේ
ඇත ගසන බෙර පදයට නොව නෙලියේ
මෑත ඇවිත් නටතෙයි රත්න වල්ලියේ "[39]

මෙවැනි සිදුවීමක් මෙකල සිදුවිණි යැයි තහවුරු තරගත හැකි තවත් එක් සාක්ෂියක් ලෙස පහත දැක්වෙන කාව්‍යයන් දැක්විය හැකිය.

ගොස් බැස මේ සිංහල රට දැක සිතු ලොල්ලේ
උඩකුඹ අග කබ ලණු බැඳ නටති පෙදල්ලේ
කඹ නැතුවට සෙනඟ ඇවිත් වටකර ගොල්ලේ
වැඩ සිටි "සෙංකඩගල" සහ නරතිනු පුල්ලේ "

අතීතයේ දී කාන්තාවන් විසින් නර්තනය කළ බව ත්‍රාසජනක නර්තනය පිළිබඳව දැක්වෙන මූලාශ්‍රයන් ඉතා අල්පය.

ගම්පහ / සියනෑ කෝරළ පුරා පමණක් ප්‍රචලිතව පවතින " යක් මඬුව " නම් වූ මොරටු දෙවියන් පිදීමේ අභිචාරයේ දී කබේ නැටුම නම් වූ නර්තනයක් රංග ගත කරනු ලබයි. මෙහිදී නර්තන ශිල්පීන් උණ ගස් දෙකක සවි කරනු ලබන කඹයක් උඩ සිට නර්තනය කරයි. මෙවැනි අවස්ථාවන් සඳහා ගාඩි වංශික කාන්තාවන් විසින් රඟ දක්වන ලද කඹේ නැටුමක වස්තු බීජයක් වන්නට ඇත. මන්ද යත් ගම්පද දිස්ත්‍රික්කය පුරා විකාශිත වලව් ආශ්‍රිත ප්‍රභූන්ගේ ආකර්ෂණය ලබා ගැනීම උදෙසා දේව විශ්වාසයන් ආශ්‍රේව මෙම නර්තනාංග බිහි වීමට " කබේ නැටුම " පදනම් වන්නට ඇත. එමෙන්ම අද්‍යතනයේ දී පවතින Tightrop Walking,[40] Aerial Rope[41] කේබල් නර්තන ( Cable Dance ) [42]

[39] සාගර නයිදේ රත්නාවල්ලීට කවි, කිරුළ ගහවෙල මාර්ටි ජයවර්ධන, සිළුමිණ (රසඳුන), සී / ස ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ඩ් සමාගම, කොළඹ 02, 1997.03.30, 4 පිටුව.,
[40] https://youtu.be/4hvpQrQqFE

[41] https://youtu.be/-yd1RjJ6jvA

[42] https://youtu.be/DJ7ICLRwt6w

ආදී ප්‍රසාංගික ඉදිරිපත් කිරීම් සඳහා වැඩි ප්‍රමාණයක් සහභාගි වනුයේ කාන්තාවන් වීම විශේෂිතය. කාන්තාවන් විසින් නර්තනය කරනු ලබන මෙම නර්තනයන් සඳහා ද පෙර දක්වන ලද රාජ සභා නර්තනය වන " කබේ නැටුම " පදනම් වන්නට ඇත. මන්ද යත් විදේශ රාජ ප්‍රභූන් ඉදිරියේ දී නර්තනය කිරීම හෝ එම අංග පිළිබඳව තම රට වැසියන්ට සම්ප්‍රේෂනය කිරීමෙන් ත්‍රාසජනක නර්තන වන Tightop Walking, Aerial Rope, Cable Dance ආදී ප්‍රසාංගික අංග බිහිවන්නට ඇත.

වශී ගුරුකම් සහ යන්ත්‍ර, මන්ත්‍ර ආදි වූ ගුප්ත විද්‍යාවන් මෙන්ම ශාන්තිකර්ම පිළිබඳව දැනුමැති පිරිස් උක්ත වංශිකයන් අතර වෙයි. විශේෂයෙන්ම " බලි ශාන්තිකර්ම" මේ කුල පිරිස් විසින් පවත්වනු ලබයි. එම සෙත්කම්හි ප්‍රධාන පුද්ගලයා " බලියා " නොහොත් " බලි ආතා " යන නාමයන්ගෙන් හඳුන්වනු ලබයි.

පහතරට මාතර නර්තන සහ ගර්භ සංරක්ෂණය උදෙසා බෙන්තර ශෛලීන්හී පවත්වනු ලබන රිද්දියාගය ශාන්තිකර්මය රිද්දි බිසවුන් මුල් කරගනිමින් පවත්වනු ලබයි.[43] මෙහිදී රිද්දි බිසව් රොඩි බිසව් ලෙස ද හඳුන්වයි. මෙම ශාන්තිකර්මයෙහි පුරාවෘත්තයෙහි රොඩියෙකු ස්පර්ශ වීම නිසා රිද්දි බිසවුන් ඇල්ලකින් පැන දිවි නසා ගත් බවත් එසේ පනිද්දී එක් බිසවක රොඩියෙකු කුල්ලකින් කුල්ලකින් අල්ලා දිවි බේරා ගත් නිසාත් එම බිසව රොඩි රැහැට සම්බන්ධ වීම නිසාත් " රොඩි බිසව "[44] යන නාමයෙන් හඳුන්වන්නට ඇත. උක්ත අවස්ථාව සිහි කිරීම උදෙසා උක්ත ශාන්තිකර්මය " කුල්ලේ පිදේනිය "[45] නම් වු අංගයක් වෙයි. රොඩි බිසවුන් සිහිපත් කිරීමේ දී ගායනා කරනු ලබන රොඩී බිසවුන්ගේ උප්පත්ති කවි මෙසේ දැක් වේ.

පැරකුම් බාහු යන - රජ සිරි විඳින බව දැන

යුධට මුල් රට යන - ගොසින් අණ බෙර ලබා සැම තැන. . .

රොඩියා පෙර මඟට - කුල්ලක් අරන් එනකොට
පැන්න බිසවුන් හට - ගත්තු කුල්ලෙන් බිසව් මෙතරට

කොයිබ සිටත් එන්නෙ ඇල්ලි මැල්ලියේ
රුහුණෙ සිටන් එන්නෙ ඇල්ලි මැල්ලියේ
අතේ පයේ ගිගිරින් සෙල්ලි සෙල්ලියේ
රොඩි රැහැට නායක රත්නවල්ලියේ "[46]

මෙම දිග කවි ගායනයන් ගාඩි වංශිකයන් අතර මුඛ පරම්පරාවෙන් පැවතෙන රත්නවල්ලී කාව්‍යයන් හා සමානය. කුල්ලේ පිදේන්න පිදීමෙන් අනතුරුව කුලු නැටුමක් ද ඉදිරිපත් කිරීම ඇතැම්

---

[43] කෝට්ටේගොඩ ජයසේන, පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය, කර්තෘ ප්‍රකාශන, ජේ. කේ. පබ්ලිකේෂන්, කටුවාවල, 2013, 33-61 පිටු.

[44] බෙන්තරගේ ලයනල්, පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්, මරදාන, ප්‍රථම මුද්‍රණය, 2005, 133, 146 පිටුව.

[45] චිත්‍රාවලිය, 146 පිටුව.

[46] කාරියවසම් තිස්ස, රටයකුම් යාග විග්‍රහය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 08, 1995, 150-151 පිටු.

ප්‍රදේශයන්හි සිදු වෙයි. එහිදී ගායනා කරනු ලබන කාව්‍යයන් ශ්‍රී ලාංකේය ජන නැටුමක් ලෙස හඳුන්වනු ලබන කුලු නැටුමේ ගායනයන්ට සමානය.

" ඈත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
මෑත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
අතේ පයේ ගිගිරිද සෙල්ලි සෙල්ලියේ
කුලු සරඹෙට එනවද රත්නවල්ලියේ "[47]

මෙහිදී ප්‍රත්‍යක්ෂ වනුයේ ශාන්තිකර්ම ආශ්‍රිත ගායනා මෙන්ම ජන නැටුම් සඳහා භාවිත කෙරෙන ගායනයන් සඳහා මෙකී කුල පිරිස් භාවිතකළ ඔවුන්ගෙන් පැවත ආ කාව්‍යයන් බලපා ඇති බවයි. ඇතැම් කෘතින්හි රොඩී බිසවුන්ගේ සහ කිරි අම්මාවරුන්ගේ සම්බන්ධතාවයක් ඇති බැව් ද දක්වා ඇත. ප්‍රභවයේදී උක්ත වංශිකයන් ජීවනෝපාය මාර්ගය උදෙසා ඉදිරිපත්කළ තැටි කැරකැවීම පසු කාලීන මහනුවර රාජධානි යුගයේදී රාජ සභා නර්තනයක් ලෙස සභාගත විය. එහිදී ඔවුන තුළ වූ සංස්කෘතික ලක්ෂණ ලක්ෂණයන්ට නවාංග අන්තර්ගත විය. රජුන් පිනවීමේදී නිරුවත් වූ උඩුකය වෙනුවට වර්ණවත්, වස්ත්‍ර සහ ආභරණ පළඳින්නට ඔවුන් උත්සුක වන්නට ඇති බව ඉහත කවියෙන් ද පැහැදිලි වෙයි. මොවුන්ගේ කලාංගයන්ට ආශික්ත වු ප්‍රභූ පැළැන්තියේ කුළවත් යැයි හඳුන්වන කාන්තාවන් පසු කාලීනව මෙම කලාංගයන් රඟ දැක්වීමට ඉදිරිපත් වන්නට, පුහුණු වන්නට ඇත. මන්දයත්, මුල්කිරිගල, ගලපාත ආදි බිතු සිතුවම්හි දැක්වෙන රබාන වාදනය කරනු ලබන කාන්තාවන් එකල ප්‍රභූ, කුළවත් කාන්තාවන් සැරසෙන රංග වස්ත්‍රාභරණයෙන් සැරසී ඇති බව විද්‍යාමාන කරයි. එම සම්භවය විශේෂයෙන්ම උඩරට ප්‍රදේශයේ ප්‍රමුඛව විකාශිත නර්තනාංගයක් වශයෙන් රබන් කැරකැවීම විකාශනය වන්නට විය.

උක්ත කරුණු විමසීමේ දී පසක් වනුයේ ගාඩි වංශිකයන් විසින් පරම්පරානුගතව පැවතෙන කලාංගයන් ශ්‍රී ලාංකේය ජන සමාජයේ කලාංගයන්ට පමණක් නොව වත් පිළිවෙත්, අභිචාර උදෙසාත් සමස්ත සංස්කෘතික ලක්ෂණ උදෙසාත් බලපා ඇති බවයි. විශේෂයෙන්ම ඔවුන්ගේ කලාංගයන් මමින් දේශීය නර්තනය, වාදන සහ ගායන සඳහා වූ බලපෑම ගෙනහැර දැක්වීම මෙහි මූලික අභිප්‍රායයි. යටත් විජිත පාගනය සහ කාර්මීකරණය ආදී දේශපාලනික හේතුවෙන් පොදු මනුෂ්‍ය කොට්ඨාසයක් ලෙස සමාජගත වීමේ භාග්‍යය ඔවුන්ට හිමි විය. නමුත් ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි ජිවත් වු ජිවත් වන සුවිශේෂී ජන කොටසකගේ ප්‍රභවය, විකාශනය, සංස්කෘතිය ආදී මූලිකාංගයන් ගෙනහැර දක්වමින් මෙවැනි සමාජකුලකයක් ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි ජිවත් වු බවට සාක්ෂියක් වශයෙන් ද මෙම පර්යේෂණ විස්තෘත පත්‍රිකාව රචනා කරන්නට විය.

**සාහිත්‍ය සමීක්ෂාව**

මෙම පර්යේෂණයේ දී න්‍යායික සාහිත්‍ය, ආනුභවික සාහිත්‍ය, අප්‍රකාශිත සාහිත්‍ය දත්ත ලබා ගැනීම සඳහා භාවිත කරන්නට විය.

**විධික්‍රමය**

චර්යාවාදි න්‍යාය මූලිකව න්‍යායාත්මක ප්‍රවේශයකින් මෙම පර්යේෂණය සිදු කරන්නට විය. එමෙන්ම දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස ප්‍රත්‍යෙක්‍ෂ අධ්‍යයන, සාකච්ඡාව, ප්‍රභූමත සමීක්ෂණ ඇසුරෙන් ගුණාත්මක පර්යේෂණයක් සිදු කරන්නට විය.

---

[47] දළුවත්ත චන්ද්‍රසේන, රිද්දියාගය හෙවත් රට යකුම, රුහුණු පොත් ප්‍රකාශන, එල්. පී. 15 පීපල්ස් පාර්ක් කොළඹ 11, 1993, 25 පිටුව.

**ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය**

කුලය පිළිබඳ සමාජ ඓතිහාසික විමර්ශනයක්, දයා අමරසේකර, නව සංස්කෘතික 1 කලාපය, 3-4 වෙළුම, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, කොළඹ 01, 1986.

[1] ජන සංගීතය, එඩ්මන්ඩ් ගනේගොඩ, ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විද්‍යාලය, FC 18, ජාතික පුස්තකාලය, කොළඹ, 1986

[1] ජන සම්මත කවි ගී (සංස්) ටී. ඇඩ්. ධර්මබන්දු, "රන් තෙළඹුව හා රත්නවල්ලි " , සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 10, 1964

ජන සාහිත්‍ය (සංස්) පීටර් විජේසිංහ, ජාතික පුස්තකාලය, 1982, 81-82 පිටු.

[1]ගාඩි වංශය, ආර්ය ප්‍රකාශකයෝ, කරුණාතිලක, ඇන්. ටී. සේනානායක කොලම්, නො 34, අඟුරුවැල්ල පාර, වරකාපොළ, ගාඩි වංශය, 1990, 38 පිටුව.

ඩේවි දුටු ලංකාව, ඩේවි ජෝන්, (අනු) එම්. එස්. සෝමරත්න, සී/ස ඇම්. සී. ගුණසේන සහ සමාගම, 1966,

[1] දේශීය ඉවුම් පිහුම්, විජේසිංහ පීටර්, ජන සාහිත්‍ය රචනා 44 වෙළුම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, කොළඹ 07, 1959

පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය, කෝට්ටේගොඩ ජයසේන, කර්තෘ ප්‍රකාශන, ජේ. කේ. පබ්ලිකේෂන්, කටුවාවල, 2013

පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, බෙන්තරගේ ලයනල්, එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්, මරදාන, ප්‍රථම මුද්‍රණය, 2005,

පුරාණ ස්ත්‍රීන්ගේ ඇඳුම් පැළඳුම්, වික්‍රමසිංහ මාටින්, මවුන්ට් මුද්‍රණාලය, ගල්කිස්ස, 1935

ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, විජයතුංග හරිස්චන්ද්‍ර, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය - 1 වන කාණ්ඩය, 1982

මධ්‍යකාලීන ලංකා සමාජය, ආරියපාල ඇම්. බී, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු ප්‍රකාශන අංශය, ලංකාණුඩුවේ මුද්‍රණාලය, 1962,

රන් තෙළඹුව නම් දොඩමළු රුක, සුනිල් විජේසිරිවර්ධන, "තීර්ථ" වසන්ත කලාපය, 1 වෙළුම, විභව් සංස්කෘතික මධ්‍යස්ථානය, 1995

රටයකුම් යාග විග්‍රහය, කාරියවසම් තිස්ස, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 08, 1995

රත්නවල්ලි මේ කවුද?, කොලට් සේනානායක, "ශ්‍රී සඟරාව" ස්වාධීන පත්‍ර සමාගම, 1982 10 බස, 21

රබන් උපතේ විසිතුරු වතගොත. අමරසිංහ ජයන්ත,

රිද්දියාගය හෙවත් රට යකුම, දළුවත්ත චන්ද්‍රසේන, දළුවත්ත චන්ද්‍රසේන, රුහුණු පොත් ප්‍රකාශන, එල්. පී. 15 පීපල්ස් පාර්ක් කොළඹ 11, 1993

රුහුණු රබන් සුරල් සව්දම් සහ රබන් සෙල්ලම්, තෙන්නකෝන් ජයතිස්ස, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, චතුරමුද්‍රණාලය, ප්‍රථම මුද්‍රණය, 2015

රොඩී ජනයා ගෝත්‍රයක් මිස කුලයක් නොවේ මහාචාර්ය ජේ. බී. දිසානායක, සිළුමිණ, සී/ ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන් සමාගම, කොළඹ 02, 1979, 06-20

ලංකා ජනතාව, නන්දදේව විජේසේකර, සී/ස ඇම්.සී. ගුණසේන සහ සමාගම, 1955

ලංකාවේ සංගීත සම්භවය, කුලතිලක ඩී. ද. එස්, ඇස්. ගොඩගේ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය, අවිස්සාවේල්ල, 2007

වන්නියේ සමාජ සංවිධානය සහ නවීකරණය, දිසානායක මුදියන්සේ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, අංක 675, පී. ද. ඇස්. කුලරත්න මාවත, කොළඹ 10, 1997

වසල සූත්‍රය, අමාවතුර සමුබුද්ධ ජයන්ති ධර්මදේශනා දෙවැනි සාණ්ඩය, අස්සගුණවත්තේ අරියජෝති ස්ථවිර (සංස්), නව ජීවන මුද්‍රණාලය, වැල්ලම්පිටිය, බු.ව. 2500 (1950) 2 වන පරිච්ඡේදය.

සබරගමු නර්තන සම්ප්‍රදාය හා ශාන්තිකර්ම, වික්‍රමසිංහ බණ්ඩාර, සපරගමු සාම්ප්‍රදායික කුමාර සමයට, විශේෂ සමරු කලාපය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1995

සංඛ, ජූලි - දෙසැම්බර්, (සංස්) මහාචාර්ය මුදියන්සේ දිසානායක, ශස්ත්‍රපති ටියුරින් අබේවික්‍රම, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2004 අප්‍රේල් 29

සාගර නයිදේ රත්නාවල්ලීට කවි, කිරුළ ගහවෙල මාර්ටි ජයවර්ධන, සිළුමිණ (රසඳුන), සී / ස ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ඩ් සමාගම, කොළඹ 02, 1997.03.30,

සිංහල සිරිත් සංග්‍රහය, (සංස්)ඩී. ඊ. හෙට්ටිආරච්චි, වෙස්ලි මුද්‍රණාලය, කොළඹ 06, 1983

සිංහල ශබ්ද කෝෂය, ඩී. බී. ජයතිලක, ප්‍රථම භාගය, "අ-පෑ".

සිංහල ශබ්ද කෝෂය, 21 කාණ්ඩය, 41 භාගය, සංස්කෘතික අමාත්‍යාංශය, 1992, 475 පිටුව

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, වැලිවිටියේ සෝරත හිමි. (සංස්) අනුල මුද්‍රණාලය, ඩීන්ස් පාර, කොළඹ 10, ප්‍රථම භාගය, ද්විතීය මුද්‍රණය, 1963, 330 පිටුව.

Handsome Beggers the Rodiya of Ceylon, M. D. Raghavan, Colombo, Book Centre, 1957

Sinhala Verse : Hugh Neville ,Volume 01,02

**රූපාවලිය**



රූපය 01-රාජකීය පෙරහැර සිතුවම, කුමාරකන්ද මහා විහාරය



රූපය 02- තේලපත්ත ජාතකය සිතුවම, මුලිරිගල රජමහා විහාරය



රූපය 03- අද්‍යතන රබන් නර්තන ශිල්පිනියක්



රූපය 04- විදේශීය රබන් නර්තන ශිල්පිනියක්



රූපය 05- වේදිකාව තුළ රබන් කරකවනු ලබන නර්තන ශිල්පිනියක්